කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2009

(2010 මැයි / ජූනි)

මානවශාස්ත්‍ර පීඨය

බෞද්ධ සංස්කෘතිය - BUCU- E2025

බෞද්ධ සමාජ චින්තාව පුදසිරිත් හා උත්සව

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි    කාලය : පැය 03 යි

---

1. මිනිස් සමාජයේ පරිණාමයට තුඩුදෙන ආර්ථික හා දේශපාලන සාධක පිළිබඳ බෞද්ධ අවදිකම අග්ගඤ්ඤ සූත්‍රය ඇසුරින් පෙන්වා දෙන්න.

2. "දිව්‍යමය හැකියාව වුව ද ඉක්මවා යාමට මානව හැකියාව සමත් වෙයි." බෞද්ධ ඉගැන්වීම් අනුව විමර්ශනය කරන්න.

3. සිව් බඹවිහරණ හා සිව්සඟරාවත් හඳුන්වා දෙමින් එම ඉගැන්වීම් තුළින් සමාජානුයෝගී පුද්ගලයෙකු බිහිවන ආකාරය විමසන්න.

4. ගිහි පැවිදි සම්බන්ධය පිළිබඳ බුද්ධානුශාසනා පෙන්වා දෙමින් ඒවායේ අද්‍යතන වැදගත්කම ඇගයුමට ලක් කරන්න.

5. ධාර්මික ධනෝපායනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පැහැදිලි කරමින් එය ආර්ථික සුරක්ෂිතතාව පිණිස අත්‍යවශ්‍ය වන්නේ කවර කරුණු නිසාදැයි පෙන්වා දෙන්න.

6. "පරාර්ථචර්යාවේ පරමාදර්ශය බෝධිසත්ව ප්‍රතිපදාවය" දස පාරමිතා ඇසුරෙන් සාකච්ඡා කරන්න.

7. රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් යුද ගැටුම් වළකාලමින් සාමූහික සහජීවනය ගොඩනගන අයුරු සනිදර්ශනව පැහැදිලි කරන්න.

8. සමාජ පරිහාණියට තුඩු දෙන විවිධ හේතු ව්‍යවහාරික වශයෙන් ඉතා පුළුල්ව විවරණය කිරීමට බුදු සමය සමත්ව ඇති ආකාරය පරාභව සූත්‍රය ඇසුරෙන් විමර්ශනය කරන්න.

9. "මිනිසුන් වරදින් මුදාගත හැක්කේ දඬුවම් දීමෙන් ම නොව වරදට තුඩු දෙන විවිධ හේතු නැති කිරීමෙනි " බුදු දහම අනුව විමසන්න.

10. පහත දක්වෙන මාතෘකාවලින් <u>දෙකකට</u> ප්‍රමාණවත් විවරණ සපයන්න.
    1. බුදුරදුන්ගේ සාමයික සහජීවනය
    2. ධන පරිහරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්
    3. අඹු සැමි සම්බන්ධය පිළිබඳ බුද්ධානුශාසනා
    4. ත්‍රිවිධ චෛත්‍යය පිළිබඳ බෞද්ධ සංකල්පය